# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## පුරප්පාඩු

මෙහි පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර : වෙරළබඩ පහන් පරීක්ෂක

(අ) වැටුප :

වැටුප් කාණ්ඩය : 7:3 (T 3)

මූලික වැටුප : රු. 37,330/=

වාර්ෂික වේතනාධිකය : රු. 805/=

(දළ වැටුප මාසිකව රු. 80,000/= ක් පමණ වේ.)

(ආ) යෝග්‍යතාවය :

අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී එකවර විෂයයන් 03 කින් සමත් විය යුතු අතර, අ.පො.ස (සා. පෙළ) විභාගයේදී ගණිතය හා විද්‍යාව විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව ඉංග්‍රීසි භාෂාව සමත්ව තිබීම.

**සහ**

විදුලි/විද්‍යුත් ක්ෂේත්‍රයට අදාළව හතරවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 04) හෝ ඊ හා සමාන සහතිකයක් ලබා තිබීම.

**සමග**

රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විදුලි/විද්‍යුත් ක්ෂේත්‍රයේ කාර්මික ශිල්පියෙකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද

(ඇ) අනෙකුත් අතිවාර්යය අවශ්‍යතා :

i. සාමාන්‍ය ආරක්ෂාව – ප්‍රථමාධාර පිළිබඳ සහතිකය
ii. පුද්ගල ආරක්ෂක ශිල්ප ක්‍රම පිළිබඳ සහතිකය
iii. ගිනි නිවීම හා ගිනි වැළැක්වීම පිළිබඳ සහතිකය
iv. වැඩබිමේ සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ සහතිකය

(ඈ) වෙනත් සුදුසුකම් :

පිහිනීමේ හැකියාව තිබිය යුතුය.

සියලුම වෙරළබඩ පහන් සම්බන්ධයෙන් වූ යාන්ත්‍රික කාර්යයන් පිළිබඳ අවබෝධය

(ඉ) වයස් සීමාව :

අවුරුදු 18-45 අතර විය යුතුය.

(රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.)

**සටහන :**

i. අවශ්‍ය වුවහොත් සුදුසුකම්ලත් අයදුම්කරුවන් ලිඛිත/ප්‍රායෝගික සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීම අවශ්‍ය කෙරේ.
ii. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.

**සැලකිය යුතුයි :**

- ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ ඉදිරියේදී සම්පාදනය කරනු ලබන සියලුම නීතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියාකළ යුතුය.
- තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාසයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.
- අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග "ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන), මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13" යන ලිපිනයට ලැබෙන සේ 2024.03.28 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"වෙරළබඩ පහන් පරීක්ෂක තනතුර සඳහා"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.
- **අදාළ සහතික වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- රජයේ හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සභාපති**